# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973 (HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1490 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 20/09/2024<br>පැය 0700 | | |

## මාධ්‍ය නිවේදනය

**මිදිගම පොලිස් වසමේ සිදුකළ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුර.**

2024.09.19 වන දින මිදිගම පොලිස් වසමේ ගොවියාපාන පාලම අසලදී ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කර තවත් පුද්ගලයන් දෙදෙනෙකුට තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් පොලිස් විශේෂ කාර්ය බලකා පුෂ්පාරාම උප කඳවුරේ නිලධාරීන් විසින් විමර්ශනය සිදුකර 2024.09.19 වන දින දහවල් කාලයේදී මිදිගම පොලිස් වසමේ දිගරැද්ද හා හාතපැලැන ප්‍රදේශවලදී මෙම ඝාතනයට ආධාර අනුබල දුන් සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන මිදිගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත. සැකකරුවන් සන්තකයේ තිබී **හෙරොයින් ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 500 ක් සහ ත්‍රිරෝද රථයක්** පොලිස් භාරයට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 38 හා 30 වයස්වල පසුවන කෝට්ටේ හා අඟුළුගහ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

එක් සැකකරුවෙකු වෙඩික්කරුවන්ට රැඳී සිටිමට නවාතැන් ලබා දීම සම්බන්ධයෙන්ද අනෙක් සැකකරු වෙඩික්කරුවන් ත්‍රිරෝද රථයෙන් රැගෙන යාම සිදුකර ඇති බවට අනාවරණය වී ඇත. මිදිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**